ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ණය අංක 2758 - එස්ආර්අයි)- 2014

-----------------------------------------------------------------------------------------------------------

ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ජුලි 22 දින එළඹි අංක 2758 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ හා ව්‍යාපෘති ගිවිසුමේ (අ) ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජාතික ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නාගරික සංවර්ධන , ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන ජලපවහන මණ්ඩලය (ජාජසජම) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. නැගෙනහිර පළාතේ මූතූර් නාගරික ප්‍රදේශයේ 52,000 ක් වූ ජනතාවට ආරක්ෂිත ජලය සැපයීම හා ජල ආංශික ආයතන ශක්තිමත් කිරීම මඟින් ආරක්ෂිත ජලය සැපයීම සඳහා ධාරිතාවය වැඩි කිරීමයි. පිරිවැය ඇස්තමේන්තුව ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,942 කට සමාන එජඩො මිලියන 17.87 ක් වන අතර ඉන් රු.මිලියන 1,446 ක් හෙවත් සියයට 74 කට සමාන එජඩො මිලියන 13.3 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. රු.මිලියන 497 ක් හෙවත් සියයට 26 කට සමාන එජඩො මිලියන 4.57 ක් මූල්‍යායනය කිරීමට ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. ආරම්භයේදී ව්‍යාපෘතියේ කටයුතු 2014 ජුනි 30 දිනට නිම කිරීම සඳහා සැලසුම් කර තිබූ අතර පසුව එය 2015 ජුලි 31 දක්වා දීර්ඝ කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි

ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම, ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---

2.1 මතය

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 1.3 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද දේපල, පිරියත හා උපකරණ ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදනය කරනු වෙනුවට වර්ධක මෙහෙයුම් පිරිවැයට අයකර තිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වෙනත් ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය තුළ දරන ලද එකතුව රු.මිලියන 6.5 ක වියදම් මෙම ව්‍යාපෘතියේ පිරිවැය ලෙස සලකා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණයගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | 2014 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2014 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 13.30 | 1,445.71 | 494.53 | 388.78 | 9.89 | 1,258.81 |
| ශ්‍රී ලං ර | 4.57 | 496.76 | 69.57 | 88.73 | 3.25 | 376.36 |
| එකතුව | 17.87 | 1,942.47 | 564.10 | 477.51 | 13.14 | 1,635.17 |

සැලසුම් කරන ලද කාල පරිච්ඡේදය තුළ වෙන්කරන ලද සම්පත් යොදා ගනිමින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගනු පිණිස සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදී වශයෙන් වගකීම් සකස්කර මූල්‍ය හා භෞතික ඉලක්ක මතුකර දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතිය එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

මූතූර් හි ප්‍රධාන වැඩ, පිරිසිදු නොකළ ජලය සම්ප්‍රේෂණය, සහ පිරිසිදු කිරීම් පිරියත ඉදිකිරීම සඳහා නිමකිරීමට සැලසුම් කරන ලද ආරම්භක දිනයේ සිට මාස 11 කට වැඩි කාලයක ප්‍රමාදයන් සහිතව 2014 නොවැම්බර් 28 දින සම්පූර්ණයෙන් නිමකර තිබුණි. කෙසේ වුවද ප්‍රමාදයට හේතුව විගණනයට පැහැදිලි කර නොතිබුණි.

3.3 මතභේදයට තුඩු දෙන කරුණු

------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ පරිපාලන වැඩ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ව්‍යාපෘතිය විසින් බඳවා ගෙන තිබුණද, පරිචයක් වශයෙන්, ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා පාරිශ්‍රමික ගණනය කිරීම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකරන අතර පොදුකාර්ය පිරිවැය ගාස්තු ලෙස වැටුප් වියදමෙන් සියයට 20 ක් ව්‍යාපෘතියෙන් අය කරනු ලැබේ. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට එසේ ගෙවන ලද පොදු කාර්ය ගාස්තු රු.මිලියන 2.8 ක් විය.

(ආ) කොන්ත්‍රාත්කරුට හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 6.2 ක් හා රු.මිලියන 4.9 ක්වූ මුදල් මහා භාණ්ඩාගාරයෙන් තහවුරු කිරීමක් කර නොතිබුණද රජයෙන් ලැබිය යුතු ප්‍රදානවලින් නිරවුල් කිරීමට අපේක්ෂා කර ඒ අනුව ගිණුම්කරණ ගැලපීම්ද කර තිබුණි.

3.4 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.1,162,504,731 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් ප්‍රධාන බෙදාහැරීම් නලය (කිලෝමීටර 10.5) සඳහා පිරිසිදු කළ ජල පොම්ප සැපයීම හා එළීම පිළිබඳ කොන්ත්‍රාත්තු සහ උස් ජල පිරිසිදු කිරීම් පිරියත 2 ක් ඉදිකිරීම වර්ෂ 2 ක ප්‍රමාදයකින් පසුව 2011 සැප්තැම්බර් 30 දින ඉදිකර තිබූ අතර, අදාළ කොන්ත්‍රාත්තුවට සමගාමීව නිමකිරීමට සැලසුම් කරන ලද පිරිසිදු නොකළ ජලය සම්ප්‍රේෂණ පිරිසිදු කිරීම් පිරියත සහ පිරිසිදු කළ ජල පොම්ප වැනි වෙනත් කොන්ත්‍රාත් යටතේ අදාළ වැඩ නිමකිරීමේ ප්‍රමාදය හේතුවෙන් 2014 දෙසැම්බර් 31 වන විටත් ඒවා නිෂ්කාර්යව පැවතුණි.

(ආ) රු.මිලියන 7.2 සිට රු.මිලියන 18.4 දක්වා පරාසයක වූ මුදල් ශේෂයක් මුළු සමාලෝචිත වර්ෂය තුළම ව්‍යාපෘතියේ බැංකු ජංගම ගිණුමේ පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව ණය මුදල් අරමුණු කළ කාර්යයන් සඳහා ඵලදායීව යොදා ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

4 මූල්‍ය පාලන පිළිබඳ කරුණු

---------------------------------

2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර විගණනයකට භාජනය කර නොතිබුණි.